# කෘෂිකාර්මික ණයදීමේ නවයෝජනා ක්‍රමය

**1967 සැප්තැම්බර් 1 වැනිදා සිට ක්‍රියාත්මක වීමට නියමිතය.**

කෘෂිකාර්මික ණයදීමේ නවයෝජනා ක්‍රමය සැකසී ඇත්තේ ණයදීමේ වැඩ පිළිවෙල කඩිනම් කිරීමටයි. විවිධ සේවා සමූපකාර සමිතිවලට හා එවැනි සමිතිවලට සාමාජිකයින්ට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් දැනට දෙනු ලබන සෑම ණය මුදලක් සම්බන්ධයෙන් ණය අවශ්‍යතාවයන් නිෂ්පාදන සැලසුම් සමග සම්බන්ධ කිරීම කෘමී පලිබෝධකයින් හා රෝග නිවාරන ක්‍රම, ජේලියට වී ඇට දැමීමට හෝ පැල සිටුවීම, වල් පැල නෙලීම, රසායනික පොහොර යෙදීම, වැඩිදියුණු කල බීජ පාවිච්චිය ආදී වැඩිදියුණු කල ගොවිතැන් ක්‍රම යටතේ ඇති අක්කර ප්‍රමාණය ඉක්මණින් වැඩි කිරීම කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ කෘෂිකර්ම සංවර්ධන යෝජනාවලියෙන් බලාපොරොත්තු වෙයි. මීට කලින් කවමදාවත් අනවශ්‍ය වූ සැටියෙන් මේ ගොවි වැඩ ක්‍රියාත්මක කිරීමට මෙදා මුදල් අවශ්‍ය වෙයි. මෙම කාර්‍යය ඉටු කිරීමට ණය බෙදා හැරීම කරනු ලබන ආයතනයන්ගේ හැකියාවන් මත අමාත්‍යාංශයේ කෘෂිකර්ම යෝජනාවලියේ සාර්ථක භාවය රඳා පවතී.

විවිධ සේවා සමූපකාර සමිති මගින්,,දැනට රජයෙන් දෙන ණය මුදල් බෙදා හරිනු ලැබේ. 1965 වසරේ ලංකාවේ විවිධ සේවා සමූපකාර සමිති 5,053ක් තිබූ අතර, එම වසරේම එහි සාමාජිකයින් 8,03,743 දෙනෙක් සිටියෝය. මෙම ණය මුදල් ලබාගැනීමේ සුදුස්සෙකුවීමට අඩුගණනේ එක් කොටසක වටිනාකමවත් මිලදී ගෙන සෑම ගොවියෙක්ම සමූපකාර සමිතියක සාමාජිකයෙක් විය යුතු යයි බැඳීමක් තිබේ. සමූපකාර සමිතියක එක් සාමාජිකයෙක් ලබාගත යුතු සම්පූර්ණ කොටසක වටිනාකම රු. 50 කි. එහෙත් මෙම මුදල් ප්‍රමාණය ගෙවිය යුත්තේ වාර්ෂික ගෙවීම් දහයකිනි. පළමුවන වාර්ෂික කොටස් මුදල් ගෙවීම සම්පූර්ණ කල සාමාජිකයෙකුට සමිතියෙන් ණය මුදල් ලබා ගැනීමේ වර ප්‍රසාදය ලැබේ. එමෙන්ම තවදුරටත් ණය මුදල් ලබා ගැනීමේ හිමිකාරයෙක් වීමට වාර්ෂික කොටස් මුදල් ගෙවීම නොකඩවාම සිදු කළ යුතුය. කලින් ලබාගත් ණය මුදල් කලට වේලාවට නොගෙවීමෙන් සාමාජිකයෙකුට තම සමිතියෙන් තවදුරටත් ණය ලබා ගැනීමේ ඇති ඉඩකඩ ඇහිරීයයි.

### තුන් ආකාරයක ණය මුදල් ගොවියන් වෙත ලබාදෙනු ලැබේ

(i) රසායනික පොහොර බීජ ද්‍රව්‍ය මිලයට ගැනීමට හා ගොවිකම් කටයුතු සඳහා ගොවියන් වෙත සමූපකාර සමිති මගින් කෙටි කාලීන ණය මුදල් ලබා දෙනු ලැබේ.

(ii) කෘෂිකාර්මික ආම්පන්න කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර හා වෙනත් කෘෂිකාර්මික අවශ්‍යතාවයන් මිලදී ගැනීමට ගොවියන්ට සමිති මගින් මධ්‍යම කාලීන ණය මුදල් ගෙවනු ලැබේ.

(iii) මූලධන වියදම් සඳහා ගබඩා පහසුකම්, ප්‍රවාහන පහසුකම්, යන්ත්‍ර සූත්‍ර මිලයට ගැනීම හා බඩු වෙළඳ පොලට සකස් කිරීම ආදී කටයුතුවල මූලධන වියදම් සඳහා දිගුකාලීන ණය මුදල් කෙළින්ම සමිතිය වෙත ගෙවනු ලැබේ.

සෑම වගා කන්නයක් ආරම්භයේදීම එක් එක් සමිතියට එම සමිතිවල සාමාජිකයින් වන ගොවියන් විසින් තමතමන්ගේ අවශ්‍ය ණය ප්‍රමාණය දන්වාලීම දැන් පවතින ක්‍රමයයි. ඊලඟට සමූපකාර සමිති මගින් මෙම පුද්ගලික ඉල්ලුම් පත්‍ර අනුපිළිවෙලට සකස් කරනු ලැබේ. ඉන්පසු පලාතේ සමූපකාර සංවර්ධන උපකොමසාරිස් වෙත මෙය ඉදිරිපත් කිරීමට පෙර සියළුම ඉල්ලුම් පත්‍ර එක්කොට එක් ඉල්ලුම් පත්‍රයක් සකසා සමිතිය භාර

සමූපකාර පරීක්ෂක විසින් ඉල්ලුම් පත්‍රය අනුමත කරනු ඇත. ඉන්පසු සමූපකාර සංවර්ධන උපකොමසාරිස් එම ඉල්ලුම් පත්‍ර නැවත ක්‍රමවත්ව සකසා ගොවිජන සේවා කොමසාරිස් වෙත ඉදිරිපත් කරයි. ගොවිජන සේවා කොමසාරිස් ණය මුදල අවසාන වශයෙන් අනුමත කිරීමට පෙර සමහර විට ණය ඉල්ලුම් පත්‍රය පිළිබඳව නොයෙක් පැනයන් නැගීමට පුළුවන. ගොවිජන සේවා කොමසාරිස් ණය මුදල අනුමත කල පසු සමූපකාර සමිතිය ගනුදෙනු පවත්වා ගෙන යනු ලබන බැංකුවට චෙක්පතක් යවයි. ඉන්පසු සමූපකාර සමිතිය බැංකුවෙන් මුදල් හැරගෙන තමන්ගේ සාමාජිකයන්ට ණය මුදල් ගෙවයි.

මෙම ක්‍රමය අනුව ගොවියන් වෙත ණය මුදල් ලැබීම ප්‍රමාද වෙනවාත් හැර, සමහර විට ණය මුදල් ලැබෙනවිට ගොවියන් විසින් වගා වැඩ අරඹා අවසානය. මූලික වශයෙන් මෙය සිදුවන්නේ ගොවියා වර්ෂාව පැමිණෙන තෙක් බලාසිට එම කන්නයේ පවතින වර්‍ෂා තත්ත්වය අනුව එම කන්නයේ වගා කල හැකි අක්කර ප්‍රමාණය නිගමනය කොට ඉන් අනතුරුව තම සමූපකාර සමිතියට ණය මුදල් ඉල්ලුම් පත ඉදිරිපත් කිරීමට පුරුදු වී සිටින බැවිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වියලි කලාපයේ මාස්කන්නය සඳහා ගොවියන් විසින් ණය ඉල්ලුම් පත් ඉදිරිපත් කරනුයේ ඔක්තෝබර් මාසයේ ඊසාන දිග මෝසම් සුලඟ ඇරඹීමත් සමගය. ඉන්පසු එම ඉල්ලුම් පත් සමූපකාර සමිති සමූපකාර පරීක්ෂක, සමූපකාර සංවර්ධන උපකොමසාරිස් හා ගොවිජන සේවා කොමසාරිස් යන නිලධාරීන් මගින් සැකසී පරීක්ෂා වී අනුමත වීමට මාස දෙකක පමණ කාලයක් ගතවන අතර, ගොවියෝ වෙළඳුන් ගෙන් හා අතුරු මැදියන් ගෙන් ඔවුන්ගේ වගා වැඩ සඳහා ණය මුදල් ලබා ගනිති. එහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ණය මුදල් අවසාන වශයෙන් ගොවියා වෙත ලැබෙන අවස්ථාවේදී වෙළඳුන්ගේ හා අතුරු මැදියන්ගේ ග්‍රහනයෙන් ගොවියන් මුදා ගැනීම දුෂ්කරය. සමූපකාර සමිතිය ග්‍රාමීය මට්ටමේ, ගොවියන් වෙත ණය ලබාදීමේ ආයතනය වශයෙන් නව යෝජනා ක්‍රමය යටතේ ද තව දුරටත් තිබේ. එමෙන්ම කලින් පැවති පිළිවෙලට ගොවියෝ තමන්ගේ ණය ඉල්ලුම් පත් සමූපකාර සමිති වලට ඉදිරිපත් කරනවා ඇත. එහෙත් මුදල් මුදා හැරීම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් නොකෙරෙනවා ඇත. ඒ වෙනුවට මහජන බැංකු, ලංකා බැංකු හා මඩකලපුවේ ඇති සමූපකාර බැංකු වැනි ආයතන වලින් ණය ගනුදෙනු වැඩ කෙරෙනවා ඇත. නව ණය ව්‍යාපාරයට මුදල් යෙදවීමට මෙවැනි බැංකු 60ක් පමණ ඇති බැවින් විවිධ සේවා සමූපකාර සමිති මගින් ණය මුදල් බෙදා හැරීම දැන් මෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව පමණක් පාලනය කරන පිළිවෙලට වඩා ශීඝ්‍ර ලෙස ඉක්මනින් කල හැකිවෙයි.

තමා වගා කිරීමට යෝජනා කර ඇති බෝගයට සරිලන පරිදි එක් එක් ගොවියාගේ සත්‍ය අවශ්‍යතාවයන් හා ඉල්ලුම් කරණ ණය ප්‍රමාණයන් සසඳන නිසි ක්‍රමයක් දැනට නොමැත. ඒ අනුව කෘෂිකාර්මික ණය වැරදි ක්‍රමයට පාවිච්චි කෙරෙන අවස්ථා බොහෝය. යෝජනා කර ඇති නව ණය ක්‍රමයේ මෙම වැරද්ද මග හැරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා සම්බන්ධිත අනික් දෙපාර්තමේන්තු දිසාපති යටතේ එකමුතුව ගොවි කාරක සභාව සමග සාකච්ඡා කොට නිෂ්පාදන වැඩ පිළිවෙලක් පිළියෙල කරනු ඇත. ගොවි කාරක සභාව මගින් පිළියෙල කර ඇති නිෂ්පාදන වැඩ පිළිවෙලට ගොවියන් විසින් ඉල්ලා ඇති ණය මුදල් අනුකූල යයි සෑම ගොවි කාරක සභාවක් භාරව සිටින ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ඕවර්සියර්, ඉඩම් සංවර්ධන ඕවර්සියර් හෝ ආහාර නිෂ්පාදන ඕවර්සියර් හෝ සෑම පුද්ගලික ගොවියෙකුගේම ණය ඉල්ලුම් පත්‍රය සහතික කරනු ඇත. (ගොවිජන සේවා කොමසාරිස් වෙළඳ බැංකු සමග සාකච්ඡා කොට මේ සඳහා අවශ්‍ය පෝර්මයක් පිළියෙල කරනු ඇත.) සෑම වගා කන්නයකටම තුන් මසකට ප්‍රථම මෙසේ කරනු ඇත. මෙම සහතිකය නොමැති කිසිම ණය මුදලක් මුදවා හරිනු නොලැබේ. නව ණය යෝජනා ක්‍රමයේ මෙය ඉතා අත්‍යාවශ්‍ය අංගයකි. ඕවර්සියර් විසින් සහතික කරනු ලැබූ පුද්ගලික ඉල්ලුම් පත සමිතියට ලැබුණු පසු එහි කාරක සභාව විසින් ඉල්ලා ඇති ණය මුදල සම්බන්ධයෙන් සාමාජිකයාගේ සුදුසු නුසුදුසු භාවය ගැන පරීක්ෂණ පවත්වයි. කන්නය ඇරඹීමට මාස දෙකකට පෙරාතුව, මෙම පරීක්ෂණය

[illegible] කළ යුතුය. සමුපකාර සමිතිය සෑම [illegible] ඉල්ලුම් පතක්ම පිරික්සා අවසන් කොට [illegible]මන් ගනුදෙනු කරන ලඟම ඇති බැංකු ශාඛාවට පුද්ගලික ඉල්ලුම් පත් ගොනු කොට සෑදු එක් විශාල ඉල්ලුම් පතක් යවනවා ඇත. එම තනි විශාල ඉල්ලුම් පතට සමුපකාර සමිතිය ක්‍රියාත්මක වන පෙදෙස තුල ඇති ගොවියාගේ සම්පූර්ණ ණය අවශ්‍යතාවයන් ගැබ් වූ ආධාර ලේඛනයකින් ද සමන්විත වෙයි. වගා කන්නය ඇරඹීමට අඩු ගණනේ මාස 1½ හමාරකට වත් පෙරාතුව ණය ඉල්ලුම් පත බැංකුවට ලගා විය යුතුය. ඒ අනුව ණය මුදල් දෙන බැංකුවට ණය ඉල්ලුම් පත්‍රය පිරික්සීමට කාලය ලැබෙන අතර, බැංකුවේ අභිමතය පරිදි ණය ඉල්ලුම් පත පිළිබඳව පැනයන් නැගීමට ද කාලය තිබේ. කන්නය මුලදී, වර්ෂා පතනයේ තත්ත්වය දැනගත් පසු සමිතියේ කාරක සභාව සෑම පුද්ගලික ඉල්ලුම් පතක්ම නැවතත් පරීක්ෂාකර, අළුත් තත්ත්වයන් යටතේ කොපමණ ඉඩම් ප්‍රමාණයක් වගා කළ හැකි ද ආදී කරුණු සලකා බලනු ඇත. කාරක සභාවේ මෙම රැස්වීමට අවුරුද්ද සඳහා මුල් නිෂ්පාදන සැලසුම් පිළියෙල කල ගොවි කාරක සභාවේ සාමාජිකයින් හා අනිකුත් රජයේ නිලධාරීන් ද හවුල් කරගනු ලැබේ. කලින් ඉල්ලන ලද තාවකාලික ණය මුදල් යටතේ ඇත්ත වශයෙන්ම මුදා හැරීමට අවශ්‍ය ප්‍රමාණයන් දක්වන ආධාර ලේඛනයක් සහිත සංශෝධනය කරන ලද පරිපූර්ණ ණය ඉල්ලුම් පතක් සමිතිය මගින් ඊලඟට පිළියෙල කරනු ඇත.

මෙම සංශෝධිත ඉල්ලුම් පත හා ආධාර ලිපි ලැබුන විගස කලින් ඉල්ලුම් පත ගැන පිරික්සා ඇති ණය දෙන බැංකුව වහාම එම ණය මුදල මුදා හැරිය යුතුය. මෙම නව පිළිවෙල යටතේ වගා කන්නය ඇරඹීමට පෙරාතුව ණය මුදල් මුදා හැරීමට බැංකුවට හැකිවෙයි. එමගින් පිට අයවළුන් ගෙන් ණය මුදල් ලබා ගැනීමේ අවශ්‍යතාවයක් ගොවියාට ඇති නොවේ.

රජය මගින් වර්තමාන ණය මුදල් දීමේ දී පොලී අය කරන ප්‍රමාණයන් අනුව විශාල සහනතාවයක් සැලසේ. ඇත්ත වශයෙන් මෙම මුදල් සම්බන්ධයෙන් සිදුවන අක්‍රමික තාවයන් සමහර විට වෙළඳපොලේ පවතින මිල අධිකවීම නිසා ඔවුන්ට ලත් මුදල් නැවතත් ණයට දීමට මුදල් ණයට ගන්නන් පෙලඹීම නිසා විය හැක. එබැවින් පොලී සඳහා ද තවත් සහනතාවයන් සැලසීමට අවශ්‍ය නොවේ.

එබැවින් ගම්බද අයට ණයදීමේදී ඇතිවන විශාල හැක සහිත භාවය හා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන අතිරේක පරිපාලන වියදම් පිරිමසා ගැනීමට සෑහෙන ආදායමක් ණය දීමේ ආයතන වලට ලබා ගැනීමට හැකිවනසේ නව ණයදීමේ යෝජනා ක්‍රමයෙන් ගම්බද අයට දෙන ණය මුදලට අයකරන පොලී ප්‍රමාණය තීරණය විය යුතුය. එබැවින් දැනට අයකරන සියයට 4-5 දක්වා ප්‍රමාණය වෙනුවට අවුරුද්දකට සියයට 12 හේ පොලියක් අය කිරීම සුදුසුයයි හැඟේ. දැනට ගොවියන් නොගෙවා ඇති ණය මුදල් ප්‍රමාණය මෙම නව ක්‍රමය ක්‍රියාත්මක කරන බැංකු වලට ගැටළුවක් වෙනවා ඇත. ගොවියන් විසින් ආපසු ගෙවන මුදල් පසුගිය නොගෙවූ ණය මුදල් වෙනුවෙන් අඩුකළොත් බැංකු වලද කල් ඉක්ම ගිය ණය මුදල් ප්‍රමාණය අති විශාල වනවා ඇත. එබැවින් 1958/59 කාල සීමාවට පෙර ගොවියන් වෙත දෙන ලද සියළුම ණය මුදල් සම්පූර්ණයෙන් හෝ අසම්පූර්ණයෙන් බෝග පාළුවූ පෙදෙස් වල ගොවියන් විසින් ඉන් මෙපිට වසරවල


4—එච 3794 (67/4)

දී ගන්නා ලද ණය මුදල් ද පොත් පත් වලින් කපා හැරීමට රජය තීරණය කොට ඇත. එමෙන්ම 67.9.1 දිනට මෙපිට බැංකු වලින් ගන්නා ණය මුදල් නිසියාකාර ගෙවන්නේ නම්, වෙනත් කල් ඉක්මගිය ණය මුදල් වුවද, පොත්පත් වලින් කපා හරිනු ලැබේ. ඒ අනුව 1967 සැප්තැම්බර් මාසයේ කෘෂිකාර්මික ණයදීමේ ක්‍රමය බැංකු පවරාගත් පසුවද පැරණි ක්‍රමය යටතේ ණය ගන්නා ලද තමුන්ගේ ණය ගෙවීම පැහැර හරින ලද අයවළුන්ට හෝ සමිති වලට ණය මුදල් දීම වැලැක්වීමක් නොකෙරේ.

මෙම නව ණයදීමේ ක්‍රම ක්‍රියාත්මක වන්නේ සමූපකාර සමිති වල හෝ එහි සාමාජිකයින්ට හෝ දෙන ලද ණය මුදල් ගැන පමණයි. බැංකු මගින් කෙලින්ම මහ ජනයා වෙත දෙන ලද ණය මුදල් පිළිබඳව මෙහි නොකියැවේ.

නිමි.

